සැ. යු.– 2007.07.13 දින පළ කරන ලද අංක 1,506 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,507— 2007 ජූලි 20 වැනි සිකුරාදා — 2007.07.20**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 718 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 724 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූලි මස 13 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිළධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සැම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවිම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (දෙමළ මාධ්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### බදුල්ල, කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (දෙමළ මාධ්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිළධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2007 අගෝස්තු මස 20 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජුනි මස 13 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය,
අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාස හා තනතුරු* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01 | බදුල්ල | බදුල්ල | බදුල්ල නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| 02 | බදුල්ල | සොරනාතොට | සොරනාතොට කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වියළුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |
| 03 | බදුල්ල | ලුණුගල | පට්ටිපොල කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ යටිකිඳ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යලය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාස හා තනතුරු | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 04 | බදුල්ල | ලුණුගල | ඔප පලාත නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වියළුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| 05 | කොළඹ | කොළඹ | මෝදර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |
| 06 | කොළඹ | කොළඹ | මරදාන කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |
| 07 | කොළඹ | කොළඹ | කොම්පඤ්ඤවීදිය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |
| 08 | කොළඹ | තිඹිරිගස්යාය | කොළඹ මහ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |
| 09 | කොළඹ | තිඹිරිගස්යාය | වැල්ලවත්ත කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |
| 10 | කොළඹ | තිඹිරිගස්යාය | ද සොයිසා කාන්තා රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධුරය (දෙමළ මාධ්‍ය) | එම |

07–345

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, රෙජිස්ට්‍රාර් තනතුර

### අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපලක් හිමි, ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිළධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2007 අගෝස්තු මස 20 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජූනි මස 29 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය,
අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | මැදවච්චිය | නුවරගම් පළාත කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, අනුරාධපුරය |

07–356

---

## ප්‍රජා සංවර්ධන සහ සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශය

### සංවර්ධන සහකාර තනතුරු

ප්‍රජා සංවර්ධන සහ සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින තනතුරු 12ක් පිරවීම සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

*සේවයේ නිරත කරවීමේ කොන්දේසි* :–

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම අමාත්‍යාංශය හා රජය විසින් වරින්වර පනවනු ලබන නියෝග වලට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්විය යුතුය.
04. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
05. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. එහෙත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.
07. *අධ්‍යාපන සුදුසුකම්* :

    රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
    දෙමළ මාධ්‍යයෙන් අ.පො.ස. සා.පෙ. සමත් වී තිබීම.

08. *අතිරේක සුදුසුකම්* :-

    තනතුරට අදාලව පිළිගත් පාඨමාලාවක් හෝ කොටසක් හදාරා තිබීම.
    පරිගණක භාවිතය පිළිබඳ මාස 06 ට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.
    තනතුරට අදාල ක්ෂේත්‍රය තුළ පළපුරුද්දක් තිබීම.

09. රා.පරි.චි.ලේ. 6/2006 එම්එන් 4 -

රු. 14,850-185 x 10-210 x 4-290 x 15 - 320 x 7- 24,130 (මෙම වැටුප් පරිමාණය (III , II සහ I ශ්‍රේණි සඳහා අදාල වේ.).

10. *කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.*– තනතුරට පත්වූ දින සිට වසර 03ක කාලයක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

11. *බඳවා ගන්නා ආකාරය.*– ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

*අයදුම්පත්* .–අයදුම්පත් මෙහි දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කර 2007.08.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රජා සංවර්ධන සහ සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශය, 35ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08 " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

යූ. ඒ. සෙනෙවිරත්න,
ලේකම්,
ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා
දුරලීමේ අමාත්‍යාංශය.

2007 ජූලි මස 05 වැනි දින.

### ආදර්ශ අයදුම්පත්‍රය

### ප්‍රජා සංවර්ධන සහ සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශයේ .......................... තනතුරු සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
2. තැපැල් ලිපිනය :—————.
3. උපන් දිනය:—————.
4. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

   අවු. :—————. මාස :—————. දින:—————.
5. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද :—————.
6. පදිංචි දිස්ත්‍රික්කය :—————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
8. විවාහක/අවිවාහක බව :—————.
9. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලැබ තිබේද ? :——————.
   එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :—————.
10. අධ්‍යාපන සුදුසුකම් :—————.
    (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
11. *අතිරේක සුදුසුකම්.*–
    1.—————.
    2.—————.
    3.—————.

    (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
12. ඔබ දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් එම කාලය හා විස්තර:—————.
13. වෙනත් සුදුසුකම් :—————.

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.).

මෙම ඉල්ලුම්කරු වන ....................................................මහතා දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................වශයෙන් සේවය කරයි. පසුගිය වසර පහ තුළ ඔහු වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවත් පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කරන බව ද/නොකරන බව ද ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි.

————.
දෙපාර්තමේන්තුවේ/ආයතන
ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලබන
නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.

07-424

---

## අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරට බඳවා ගැනීම

අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. *අවශ්‍ය සුදුසුකම්* :– සෑම පුරවැසියෙකුම පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :

(අ) විශිෂ්ඨ චරිතයක් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව,

(ආ) දැනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.),

(ඇ) *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :-

(i) භාෂාව, විද්‍යාව, ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වීම (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 5කින්වත් සමත් විය යුතුය.)

හෝ

(ii) ඉහත විෂයයන්ට බී ශ්‍රේණියේ සාමාර්ථයක් සහිතව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය සමත්වීම (එක්වරකදී අවම වශයෙන් විෂයයන් 5කින් වත් සමත් විය යුතුය.)

හා

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ කාර්මික විද්‍යාලයකින් හෝ රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ රජය පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් පිරිනමනු ලබන ඡායාරූපකරණය පිළිබඳව එක් අවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන හෝ දෑ අවුරුද්දකට නොඅඩු අර්ධකාලීන වෘත්තීය පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබිය යුතුය.

(iv) ඡායාරූප ශිල්පියෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

02. *වැටුප් බණ්ඩය හා පරිමාණය* .– රා. ප. ච. 6/2006 අනුව MT — 1-2006 රු. 14,000 - 10 x120 - 11 x 140 - 6 x 210 - 14 x 290 - රු. 22,060 (III, II හා I ශ්‍රේණි සඳහා අදාළ වේ).

සටහන II, I ශ්‍රේණි සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව මගින් උසස්වීම් ලබා දෙන තෙක් III ශ්‍රේණියට අදාළ වන රු. 14,000 - 10 x 120 - රු. 15,200 වැටුප් පරිමාණය මත බඳවා ගනු ලැබේ.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

04. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 ඡේදවල විධිවිධානද අදාළ වේ.

05. *තෝරා ගැනීම*.– ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

06. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් "ලේකම්, අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12" යන ලිපිනයට 2007.07.31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. 2007.07.31 දිනට පසුව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් එවන ලිපි කවරයේ වම් කෙළවරෙහි "නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර සඳහා වන අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

07. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

08. අයදුම්පතේ සඳහන් කර ඇත්තාවූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගනු ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

සුහද කේ. ගමලත්,
ලේකම්,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය

අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර

01. (අ) නම (මුලකුරු සමග):————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඇ) මුලකුරු සමග නම (ඉංග්‍රීසි භාෂාවෙන්) :————.

02. ලිපිනය :————.
පුද්ගලික :————.
කාර්යාලීය (අදාළ නම්) :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. උපන් දිනය:————. වර්ෂය :————. මාසය :————.
දිනය :————.
05. 2007.07.31 දිනට වයස වර්ෂ :————. මාස :————.
දින :————.
06. විවාහක/අවිවාහක බව :————.
07. (අ) අධ්‍යාපනික සුදුසුකම් :————.

| *විභාගයේ නම* | *වර්ෂය* | *සමත් විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(ආ) අනෙකුත් සුදුසුකම් (ඡායාරූප ශිල්පය පිළිබඳ ලබා ඇති ප්‍රවීනත්වය):————.
(ඇ) වෘත්තීය පළපුරුද්ද :————.

| *ආයතනය* | *සේවා කාලය* | |
|---|---|---|
| | *සිට - දක්වා* | *කාල සීමාව* |
| | | |

08. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක සේවයේ නිරතව සිටියේ නම් අස්වීමට හේතුව :————.

09. සාපරාධී වරදකට අධිකරණයකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලද දඬුවම් පිළිබඳ විස්තර :————.

10. මෙම අයදුම් පත්‍රයේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගුවීමට යටත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(ආ කොටස)
(රාජ්‍ය/පළාත් සභා/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ කාර්යාලයේ සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ,පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————.
ආයතන ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

07-441

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම් දැන්වීම් අවලංගු කිරීම

මවිසින් විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් අවලංගු කිරීම පහත සඳහන් පරිදි ප්‍රසිද්ධ කරනු ලැබේ.

විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ නව පරිපාටිය (2006) ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අයදුම්පත් කැඳවීම මෙයින් අවලංගු කරමි. මේ සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ආපසු එවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම සඳහා නැවත අවශ්‍ය වුවහොත් ඒ සඳහා අවශ්‍ය දැන්වීම් *ගැසට් පත්‍රයක්* මගින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරමි.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජූනි මස 29 වැනි දින.

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය* | *අයදුම්පත් කැඳවූ කොට්ඨාශ හා තනතුරු* | *අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රය පිළිබඳ විස්තර* |
|---|---|---|---|---|
| 01. | ගම්පහ | අත්තනගල්ල | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ මංගලතිරිය බෝගමුව අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | 2005.12.16 දින සිකුරාදා අංක 1424 දරන ගැසට් පත්‍රය |
| 02. | ගම්පහ | මීගමුව | උතුරු අළුත්කුරු කෝරළේ කොට්ඨාශයේ (මීගමුව නගර ප්‍රදේශයේ) අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 03. | ගම්පහ | ගල්ගමුව කොට්ඨාශයේ මීරිගම | ගල්ගමුව කොට්ඨාශයේ උප්පැන්න මරණ හා බස්නාහිර සියනෑ කෝරළේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 04. | ගම්පහ | කටාන | දකුණු අළුත්කුරු කෝරළේ කොට්ඨාශයේ දඬුගම් පේරුවේ උදම්මිට ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 05. | ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ අධිකාරිපත්තුවේ (හෙයියන්තුඩුව) ප්‍රදේශයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 06. | ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ (වල්ගම ප්‍රදේශයේ) අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 07. | ගම්පහ | වත්තල | මත්තුමගල කොට්ඨාශයේ උප්පැන්න මරණ හා දකුණු අළුත්කුරු කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 08. | ගම්පහ | කැලණිය | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ (හුණුපිටිය ප්‍රදේශයේ) විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 09. | ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ වල්ගම මල්වාන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 10. | ගම්පහ | අත්තනගල්ල | නැගෙනහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ (කහටඕවිට ප්‍රදේශයේ) අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 11. | ගම්පහ | කැලණිය | බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ (හුණුපිටිය ප්‍රදේශයේ) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 12. | ගම්පහ | අත්තනගල්ල | නැගෙනහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 13. | කෑගල්ල | රඹුක්කන | පරණකුරු කෝරළය (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර්ධූරය | 2005.07.22 දින සිකුරාදා අංක 1403 දරන ගැසට් පත්‍රය |
| 14. | කෑගල්ල | යටියන්තොට | උඩුව පළාත් කොට්ඨාශයේ උප්පැන්න මරණ හා කෝරළ තුන හා පාත බුලත්ගම කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 15. | කෑගල්ල | කෑගල්ල | කෑගල්ල නගර කොට්ඨාශයේ උප්පැන්න මරණ හා වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය | එම |
| 16. | කෑගල්ල | මාවනැල්ල | ගල්බඩ කිනිගොඩ කෝරළේ උයන්වත්ත අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධූරය | එම |

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අවලංගු කිරීමේ නිවේදනය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2007

අංක 1501 හා 2007.06.08 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2007 " පිළිබඳ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

සංශෝධිත *ගැසට්* නිවේදනය යථා කාලයේ දී පළ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 ජූලි මස 05 වැනි දින,
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

07 – 455

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ 'ආ' ඛණ්ඩයට බඳවා ගැනීමේ තරග විභාගය - 2007

### Competitive Examination for the Recruitment of Telecommunication and Rader Technician - Class II Segment B of the Sri Lanka Technological Service - 2007

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත්, ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයකින් සුදුසුකම් ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් අතරින් කුසලතා පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

03. මෙම තරග විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් 2007 සැප්තැම්බර් මාසයේ කොළඹදී, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

04. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* .- පුරප්පාඩු සංඛ්‍යාවෙන් 90% ක් බාහිර අයදුම්කරුවන් සඳහා වෙන් කරන අතර එම තනතුරු *රජයේ ගැසට්* නිවේදනයෙන් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් පවත්වනු ලැබේ. ඉන් දක්වන කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හා ඊට සම්බන්ධව නිකුත් කරනු ලැබිය හැකි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ ආ ඛණ්ඩයට බඳවා ගැනීම කරනු ලැබේ.

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

5.1 (i) මොරටුව විශ්ව විද්‍යාලය සහ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහතිව);

හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව) ;

හෝ

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(iv) විවෘත විශ්ව විද්‍යාලයය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහිතව);

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සමත්වීමේ සහතිකය (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ සහතිව) ;

හෝ

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන යයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

5.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත)

5.3 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

5.4 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

5.5 සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල*.– මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 04 දක්වා මුල් පිටුවට ඇතුළත් වන පරිදි සකස් කරගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2007.08.24 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, "බෞද්ධාලෝක මාවත, කොළඹ 07" යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ " විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පි තනතුර යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම්පත්‍ර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

07. විභාග ප්‍රවේශ පත්‍රය, විභාග පැවැත්වෙන දිනය හා විභාග කාල සටහන විභාග අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් එවනු ඇත.

විභාග අපේක්ෂකයන්, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරනු ලබන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනීසිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් නිවේදනයක් නිකුත් කරනු ඇත. විභාගයට දින 7 කට කලින් ප්‍රවේශ පත්‍රය නොලැබුන අපේක්ෂකයින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත පහත සඳහන් විස්තර දැන්විය යුතුය.

1. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම,
2. ලිපිනය,
3. ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කර එවූ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි අංකය,
4. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සියේ අංකය සහ ලංකා බැංකු ශාඛාවේ නම.

08. ලිඛිත විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගනු ලැබේ.

09. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ලිඛිත විභාගයේදී ඉහළම කුසලතාවක් දක්වා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබාදීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

10. මෙම නිවේදනයෙන්, අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබාදීමේ අවසාන තීරණ ගැනීමේ බලය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුය.

11. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රුපියල් 237,060 කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12. *විභාග ගාස්තු.*– විභාග ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 300 ක මුදලක් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍රය ශාඛාවේ ගිණුම් අංක 70104532323311 යන ගිණුමට බැරකර ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙනසේ අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. *ලිඛිත විභාගය.*–මෙම තරග විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

(1) බුද්ධි පරීක්ෂණය
(2) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

14. *විෂය නිර්දේශය* :

(1) බුද්ධි පරීක්ෂණය : කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත ඔහුගේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

(2) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* : කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි. භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාලව විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය.

15. *තේරීම් පරිපාටිය* :

සුදුසුකම් ලැබීම සඳහා එක් විෂයකින් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලබාගත යුතුය. එසේ ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය ලත් අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. ඉහත 05 යටතේ ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ විභාගයේදී විෂයයන් දෙකෙන්ම උපරිම ලකුණු ගත් අපේක්ෂකයින් තෝරා ඔවුන් II පන්තියේ ආ ඛණ්ඩයට පත් කරනු ලැබේ.

16. *වෛද්‍ය පරීක්ෂණය* :-තෝරා ගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

17. *වැටුප් ක්‍රමය.*– (අංක 6/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MT2 - 2006 අනුව) රු. 14,140 - 10 x 140 - 11 x 150 - 6x 210 - 14 x 290 - රු. 22,510 (මාසික) රු. 14,560 වැටුපට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතය)

18. *සේවා කොන්දේසි* : -

18.1 මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත.

2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයෙකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

18.2 තෝරාගනු ලබනන් ආයතන සංග්‍රහයේ ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි හා රජය මගින් දැනට නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

18.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත්විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත්වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

18.4 ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා ඡේදවල විධිවිධාන අදාළ වේ.

*විශේෂ* :-

(i) රාජකාරි වේලාවල් සෑම විටම සාමාන්‍ය වැඩ කරන වේලාවල් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි ද ඇති වේ. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදු වේ.

(ii) ඔවුන් දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කළ යුතුවේ.

ජී. එච්. පී. ධර්මරත්න,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2007 ජූලි මස 06 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**විදුලි සංදේශ හා රේඩාර් කාර්මික ශිල්පී තනතුර සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ ආ ඛණ්ඩයට බඳවා ගැනීමේ තරග විභාගය - 2007.**

Competitive Examination for the Recruitment of Telecommunication and Rader Technician - Class II Segment B of the Sri Lanka Technological Service - 2007.

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(සිංහල - 2, දෙමළ -3, ඉංග්‍රීසි - 4)
(කොටුව තුළ අදාළ අංකය යොදන්න)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම් :———.
ඉංග්‍රීසියෙන්
උදා : (Silva A. B. C.) :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(සිංහලෙන්/දෙමළෙන්) ———. මහතා/මෙනවිය/මහත්මිය.

(ඇ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
(සිංහලෙන්/දෙමළෙන්)———.

(ඈ) ඉංග්‍රීසියෙන් :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. ස්ත්‍රී/පුරුෂ භාවය [ ] (කොටුව තුළ අදාල අංකය යොදන්න)
(පුරුෂ - 0 ස්ත්‍රී - 1)

04. ස්ථිර ලිපිනය :———.
(අ) (සිංහලෙන්/දෙමළෙන්) :———.
(ආ) ඉංග්‍රීසියෙන් :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුයි)

(ඇ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුය)

(ඈ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.
(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———.
(ඊ) දුරකථන අංකය :———.

05. (අ) උපන් දිනය :———.

වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

(ආ) 2007.08.24 දිනට වයස

අවුරුදු: [ ] මාස: [ ] දින: [ ]

06. විවාහක/අවිවාහක බව : [ ]
විවාහක - 1 අවිවාහක - 2
(අදාළ අංක කොටුව තුළ ලියන්න)

07. ජන වර්ගය : [ ]
සිංහල, 1, ද්‍රවිඩ - 2, ඉන්දියානු ද්‍රවිඩ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5
(අදාළ අංක කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන සුදුසුකම් :———.
(අ) අ.පො.ස (සා.පෙළ) විභාගය :

*පළමුවර*
වර්ෂය:———.
විභාග අංකය:———.

*දෙවන වර*
වර්ෂය:———.
විභාග අංකය:———.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාගය :
වර්ෂය :———. විභාග අංකය :———.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෘත්තීය සුදුසුකම්/තාක්ෂණික සුදුසුකම් :———.

9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :———.

9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :———.

9.3 එම උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :———.

10. වෙනත් සුදුසුකම් :———.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත. ඔව් නම් විස්තර සඳහන් කරන්න :———.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :———.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙකු නම් එසේ ඉවත් වීමට හේතුව :

14. *විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ තොරතුරු* :

14.1 විභාග ගාස්තු ගෙවූ බැංකුවේ නම :———.
14.2 බැංකු ශාඛාවේ නම :———.
14.3 මුදල් ගෙවූ දිනය :———.

මුදල් ගෙවූ ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

15. *අයදුම්කරුගේ ප්‍රකාශය*.– මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍යය බව ප්‍රකාශ කරමි. මෙම විභාගයේ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කිරීමට හෝ පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

———.
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*.
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ............................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

———.
අත්සන සහතික කරන නිළධාරියාගේ අත්සන

අයදුම්කරුගේ ආදර්ශ අත්සන———.

දිනය :———.
සහිතක කරන නිළධාරියාගේ සම්පූර්ණ නම:———.
තනතුර :———.
ලිපිනය :———.
(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත තොරතුරු සඳහන් ........................................... මහතා/මහත්මිය/මෙනවිය ......................................... කාර්යාලයේ සේවය කරන බවද ඔහු/ඇය ........................දින සිට ................................ තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :———.
සහතික කරන නිළධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.

07-425

---

## ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2006

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ පරීක්ෂණය 2007 සැප්තැම්බර් මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2006 වසරේ ඔක්තෝම්බර් 30 දිනට ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය* - I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග **I** සඳහා වූ විෂය නිර්දේශය ඇමුණුම "අ" හි ද කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වූ විෂය නිර්දේශය "ආ" හි ද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාග වල විෂයන් සඳහා පෙනී සිටීමේදී එක් වරකදී හෝ වාර කිහිපයක දී පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

| *I වන කාර්යක්ෂමතා කඩඉම* | | | *II වන කාර්යක්ෂමතා කඩඉම* | | |
|---|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | *කාලසීමාව (පැය)* | *විෂය අංකය* | *විෂයය* | *කාලසීමාව (පැය)* |
| 01 | මුල්‍ය ක්‍රම | 03 | 01 | කොටස් 01 | 03 |
| 02 | පරිපාලනය | 03 | 02 | කොටස් 02 | |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍ර 01 | 02 | 03 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය I | 03 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍ර 02 | 03 | 04 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය II | 03 |
| 05 | විශේෂ පත්‍රය* | 03 | 05 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය III | 03 |
| | | | 06 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IV | 03 |
| | | | 07 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය V | 03 |
| | | | 08 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VI | 03 |
| | | | 09 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VII | 03 |
| | | | 10 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VIII | 03 |
| | | | 11 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IX | 03 |
| | | | 12 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය X | 03 |
| | | | 13 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IX | 03 |

**මේ සඳහා අයදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිළධාරීන් පමණි.*

*සටහන.*– දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ 02 ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03හි සඳහන් ප්‍රශ්න පත්‍ර II න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි.

එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතුය.

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වන දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට පෙනී සිටින නිළධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) වලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය.

06. පහත දැක්වෙන ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ.

i. මුල්‍ය ක්‍රමය
ii. පරිපාලනය
iii. දෙපාර්තමේන්තු රෙගුලාසි I
iv. දෙපාර්තමේන්තු රෙගුලාසි II

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අනුබද්ධ අකෘතියට අනුව ෆුල්ස්කැප් තීරුවක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ෆුල්ස්කැප් තීරුවේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම්, වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත.

10. ඉල්ලුම් පත්‍ර 2007.08.10 දිනට හෝ ඊට ප්‍රථම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කවර ඉල්ලුම්පතක් වුවද, ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. යම්කිසි අපේක්ෂකයෙකුට විභාගයට යටත් පිරිසෙයින් හත් දවසකට කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඔහු විසින් ඒ බව අප්‍රමාදව විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවිඩ යවන ලිපිනය "විභාග" කොළඹ වේ.)

ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතරම පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය.

1. විභාගයේ නම:————.
2. සම්පූර්ණ නම:————.
3. සම්පූර්ණ ලිපිනය:————.
4. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය හා තැපැල් කාර්යාලය:————.

නුදුරුව සිටින අයට පණිවිඩකරුවෙකු මගින් විභාග කොමසාරිස් ජනරාල් "ඊ" ශාඛාවට දැනුම්දීමට උපදෙස් දෙනු ලැබේ.

12. ඉහත II වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජුනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේදි තමන්ගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

(අ) පළමු වතාව සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | |
|---|---|---|
| (ආ) | ඉන්පසු එක් එක් වතාව සඳහා | *රු. ශත* |
| | සම්පූර්ණ විභාගය සඳහා | 100 0 |
| | එක් විෂයකට | 50 0 |

අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාල ගාස්තු ගෙවීමට නියම වේ.

එස්. ජේ. පතිරණ,
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

2007 ජූලි මස 04 වැනි දින.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව***

***ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2006***

(විභාගයේ නම කවරයේ වම් පැත්තේ ඉහළ කෙලවරේ දැක්විය යුතුය.)

01. (අ) අගට යෙදෙන නම් මුල් අකුරු සමඟ :————.
(ආ) මුල් අකුරු වලින් හැඳින්වෙන නම් :————.
02. උපන්දිනය :————.
03. පදවි නාමය :————.
දෙපාර්තමේන්තුවේ නම :————.
04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :————.
05. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය :————.

06. නිලධාරියා ඉල්ලුම් කරන විභාගය :————.
(අදාල නොවන දෑ කපා හරින්න)
(අ)පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය/(ආ) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

07. නිවේදනයේ පළමු ඡේදය දක්වා ඇති විෂය අංක සහිතව ගන්නා විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතුය.)

i. විෂය අංකය:———. විෂය:———.
ii. විෂය අංකය:———. විෂය:———.
iii. විෂය අංකය:———. විෂය:———.
iv. විෂය අංකය:———. විෂය:———.

08. නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:————.

09. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.:————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත 08 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර මවිසින්ම අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බවද ප්‍රකාශ කරමි.

10. ගෙවන ලද විභාග ගාස්තුව රු.

| මුද්දර කොටුව |
|---|

:————.
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින් විභාග කොමසාරිස් ජනරාල්, ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, 08 වැනි ඡේදයේ ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර/මුද්දරය නිසි පරිදි අවලංගු කර ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

:————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.
(*ගාස්තුව නොගෙවන විටදී කපා දැමිය හැක.)

"අ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයන්ගෙන් සමන්විත වේ.

1. මූල්‍ය ක්‍රම
2. පරිපාලනය
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - 1
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - 2

1 මූල්‍ය ක්‍රම

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)
(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු (උදා. ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්)

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥා පනත්.

* සටහන.–*සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.*

2 පරිපාලනය

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම

(ආ)ආයතන සංග්‍රහය පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

* *සටහන* : සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40%ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

3. දෙපාර්තමේන්තු රෙගුලාසි -1

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන් ගෙන් සමන්විත පැය 02ක ප්‍රශ්න පත්‍රයකි. සත්ව පනත යටතේ ඇති ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා වූ ආඥා පනත, සත්ව පනත දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය සේවයට අදාල චක්‍රලේඛ.

* *සටහන* : සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40%ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

4 දෙපාර්තමේන්තු රෙගුලාසි - 2

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන් ගෙන් සමන්විත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි :

(අ) නිදර්ශක බෙදාහැරීම පශ්චාත් මරණ පරීක්ෂක ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව.

(ආ) කෘතිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මගින් පැටවුන් ලබාගැනීමේ හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම යොදය වෙන්කිරීම, බටර් ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය.

(ඈ) ඝාතනාගාර සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීමේ ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම.

* *සටහන.*– සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40%ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

ඇමුණුම (ආ)

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන් ගෙන් සමන්විත වේ :

1 කොටස : මෙය විෂයය නිර්දේශයේ 2:1, 2:2, 4:1, 4:2, 5:2, 5:8, 6:5, 7:2:1, 8:2, 8:2:2, 8:2:3, 8:3:1, 9:2, 9:4, 9:6, 9:7 කොටස් වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන් ගෙන් ලබාගත හැකිය.

2 කොටස : මෙම විෂයය නිර්දේශයේ 1:1:1, 1:1:4, 1:2:1, 3:2, 3:1:1, 3:1:2, 3:2:1, 10:1:1, 10:1:2, 10:1:3, 10:1:4,10:1:6, 10:2:1, 10:2.8, හා 10:4:1 කොටස් වලින් සමන්විත වේ. විෂයය නිර්දේශය පේරාදෙණිය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන් ගෙන් ලබාගත හැකිය.

| | | | |
|---|---|---|---|
| 3 කොටස : | 1 පත්‍රය | - | ව්‍යාධි විද්‍යාව |
| | 2 පත්‍රය | - | පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| | 3 පත්‍රය | - | පශු මහජන සෞඛ්‍ය |
| | 4 පත්‍රය | - | කෘෂි ව්‍යාප්තිය |
| | 5 පත්‍රය | - | ජාන විද්‍යාව හා අභිජනනය |
| | 6 පත්‍රය | - | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |
| | 7 පත්‍රය | - | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| | 8 පත්‍රය | - | සත්ත්ව පෝෂණය |
| | 9 පත්‍රය | - | තෘණ හා ගෝචර තෘණ |
| | 10 පත්‍රය | - | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| | 11 පත්‍රය | - | ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය |

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන් ගෙන් ලබාගත හැකිය.

07-406

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.